21

නූතන සිංහල නවකතාවෙහි 71 කැරැල්ල නිරූපිත ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (තෝරා ගත් නවකතා ඇසුරෙන්)

නිරෝෂිකා, යූ. එන්.[1]

මෙම අධ්‍යයනයේ දී සිදු කෙරෙනුයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත 'හෙට එච්චර කළුවර නෑ' (1975) හා ගුණසේන විතාන විසින් රචිත 'විප්ලවයේ කැරලිකාරයෝ' (1979) යන කෘතීන් දෙකෙහි 71 කැරැල්ල පිළිබිඹු වන ආකාරය පිළිබඳ සන්සන්දනාත්මක විමර්ශනයකි. 'හෙට එච්චර කළුවර නෑ' නවකතාවෙහි කථානායකයා වන අමරදාස නම් ආචාර්යවරයා සහ 'විප්ලවයේ කැරලිකාරයෝ' නවකතාවෙහි නිමල් යන චරිතවල ක්‍රියාකාරිත්වය මෙහිදී විමර්ශනයට භාජනය කෙරේ. 'හෙට එච්චර කළුවර නෑ' නවකතාවෙහි දුර සිට කැරැල්ල දෙස හෙළන දෘෂ්ටියකින් කැරැල්ල නිරූපිත බවත් විප්ලවයේ කැරලිකාරයෝ නවකතාවෙහි කැරැල්ල දෙසට යොමු කරනුයේ සමීප දෘෂ්ටියක් බවත් පෙනේ. මෙහි දී ඉහත ග්‍රන්ථද්වය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද 71 කැරැල්ල පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ වන වෛද්‍ය රුවන් එම්. ජයතුංග විසින් රචිත 71 කැරැල්ල ආරම්භයේ සිට අවසානය දක්වා පූර්ණ සමාලෝචනයක් (2011) ග්‍රන්ථය, අධිනීතිඥ යසවර්ධන අබේපාල විරචිත 71 කැරැල්ල සහ අපි (2016) යන කෘතිය හා සරත් විජේසූරිය විරචිත නිර්මාණකරණය සහ දේශපාලනය යන කෘතීන් ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන පුස්තකාල පරිශීලන ක්‍රමවේදයෙන් මෙම පර්යේෂණය සිදු කෙරේ. මෙහි දී අමරදාස යනු කැරැල්ලට ඍජු ව දායක වන හෝ ඊට පසුබිම් වන සමාජ පරිස්ථිතිය හමුවේ වැඩි පීඩාවට පත් නොවන අයෙකු ලෙස නිරූපිත ය. ඔහුට කැරැල්ල දූරස්ථ ය. එහෙත් නිමල් යනු කැරැල්ලෙහි සක්‍රීය දායකයෙකු වන අතර ඔහුගේ උපත සිදු වන්නේ ද සමාජ අසාධාරණයක ප්‍රතිඵලයක් ලෙසිනි. එබැවින් ඔහුට කැරැල්ල සමීප ය. මෙම පදනමෙහි සිට තත් කෘතීන් දෙකෙහි 71 කැරැල්ල නිරූපිත අයුරු තුලනාත්මක ව විමසන විට දූරස්ථ රූපකය හා සමීප රූපය වශයෙන් නිර්මාණක්ෂියෙහි වෙනසක් දැකිය හැකි ය. එනිසා මෙම කෘතීන් 71 කැරැල්ල පිළිබඳ ව එකිනෙකට වෙනස් අර්ථකථනයන් ඉදිරිපත් කරන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ 71 කැරැල්ල, සමාජමය පරිස්ථිතිය, දූරස්ථ රූපකය, සමීප රූපය, දෘෂ්ටිය

1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, nimaliniroshika@gmail.com